පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

දිනය : 2023 ජූලි මස 06 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023 ජූනි මස 06 දිනැති අංක 2335/08 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, කාර්මික නිලධාරීන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව බැඳී සිටින්නාවූ ද, 2023 මැයි මස 08 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්.ඒ.අයි. නලින් කුමාර නිශ්ශංක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
කොළඹ 07.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
කාර්මික නිලධාරීන්ගේ සංගමය
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 07 – 0270

---

මගේ අංකය: IR/COM/02/2019/270.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2337/06 දරන හා 2023.06.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් මීගොඩ, මුතුහේන වත්ත, නඳුන් උයන, අංක 102/33/ඒ හි පදිංචි එච්.කේ.කේ.හීනටිගල මෙනවිය සහ බත්තරමුල්ල, සෙත්සිරිපාය, 06, 07 හා 09 වන මහලේ හි පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන්, බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 09/2023 දරන හා 2023.05.17 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව

දන්වමින් එච්.එම්.රාජා කුමාරතුංග මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 09/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.06.19 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : එච්.කේ.කේ.හීනටිගල,
102/33 ඒ, නඳුන් උයන,
මුතුහේනවත්ත,
මීගොඩ.

දිනය : 2023 ජූලි මස 06 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023 ජූනි මස 19 දිනැති අංක 2337/06 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, එච්.කේ.කේ.හීනටිගල සහ නාගරික සංවර්ධන අධිකාරිය බැඳී සිටින්නාවූ ද, 2023 මැයි මස 17 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්.කේ.කේ.හීනටිගල,
102/33 ඒ නඳුන් උයන,
මුතුහේනවත්ත,
මීගොඩ.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
නාගරික සංවර්ධන අධිකාරිය
06, 07 සහ 09 මහල්,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 07 – 0271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.